# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1627/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023

දිනය / திகதி / Date – 26/12/2023 පැය 1110

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2023.12.25 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 20 | 665 | යකඩ බැරල් 05<br>තඹ දඟර 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුර.**

2023.12.25 වන දින රාත්‍රී කාලයේ පේසාලේ පොලිස් වසමේදී පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මත් කරල් 1000 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පේසාලේ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන කාටස්පත්‍රී, පේසාලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. පේසාලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුර.**

2023.12.25 වන දින සවස් කාලයේ කරදියනාරු පොලිස් වසමේ කිතුල් වැව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කරදියනාරු පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන වෙන්කල්අඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. කරදියනාරු පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුර.**

2023.12.25 වන දින උදෑසන කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේදී පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 720 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අම්බලන්ගොඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන බලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**